UNIVERSITY OF PERADENIYA SRI LANKA

## සරසවි මැණියෙනි......

නමසිය හැත්තතුන මා ඉපදුන දවසේ
සරසවි මැණියන් උණුසුම ලැබ සතොසේ
පිරි මැද හිස අදත් සනසයි ලොව රිසිසේ
ඒ පින ඔබට පුදනෙමි මතු බුදු වනසේ

හතලිස් වසක් ගත විය හිරු-සඳුට හොරෙන්
ඔබදුන් ඔවා නිති රැව් දුනි දෙකන් තුලින්
රන් කෙන්ඩියක සිහ තෙල් මෙන් රැකුනි නිතින්
මිනිසත් කම වැඩුම වෙත එය යොදමි තුටින්

ඔබ සැදූ දූ-දරුවන් ලොව තුල පැතිර ඇත
ඔබ රුව ඔවුන් මනසෙහි නිති රැඳෙනු ඇත
ඔබ ගුණ යලි යලිත් සැම දෙන වනනු ඇත
ඔබ දිවි සදා කල් පවතියි පතනු ඇත

මහවැලි නදිය සිලි-සිලි ගා බැස යනවා
හන්තානේ සුළඟ ගත සිත පුබුදනවා
ගැටඹේ විහාරය නිති සිහියට එනවා
නව ගුණ වැලෙන් වැඩු සීලය බිඳ යනවා

මහවැලි නදිය කිසිදා වියලෙන්න එපා
හන්තානෙන් නැගුන සඳ බැස යන්න එපා
සරසවි පොතේ පිටු ගැලවී යන්න එපා
එදවස මතක මනසින් ගිලිහෙන්න එපා

**මහාචාර්ය ෂෙල්ටන් පීරිස්**
සිඩ්නි විශ්ව විද්‍යාලය



THE SINHALA - DEC. 2013 - ISSN 1834-7061




